38
RECEIVED 20 MAR 2... F & M

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1698/8 - 2011 මාර්තු 22 වැනි අඟහරුවාදා - 2011.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක : 35.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1) වැනි වගන්තිය යටතේ විධානය

03 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් භාණ්ඩ සාදන්නන් සහ ළඳුන් විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන භාණ්ඩයන්හි,

(අ) උපරිම සිල්ලර මිල
(ආ) නිෂ්පාදන කාණ්ඩ අංකය
(ඇ) කල් ඉකුත් වන දිනය
(ඈ) නිෂ්පාදිත දිනය
(ඉ) ශුද්ධ බර/පරිමාව

භාණ්ඩයේ හෝ ඇසුරුමේ හෝ බහාලුමේ හෝ දවටනයේ, සඳහන් කළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් ..හ කරනු ලැබේ.

උපලේඛනය

1. හිස ගල්වන තෙල්, හිස ගල්වන ජෙල් වර්ග, හිස ගල්වන ක්‍රීම් වර්ග, ෂැම්පූ, දියර වර්ග, මුහුණේ ආලේප කරන පුයර
2. මළු හෝ බහාලුම් තුළ ඇති රටඉඳි, වියලි මිදි
3. මළු හෝ බහාලුම් තුළ ඇති ආහාර වර්ණක, ආහාර රසකාරක, ආහාර සුවඳකාරක
4. මළු හෝ බහාලුම් තුළ ඇති ක්ෂණික ආහාර ද්‍රව්‍ය
5. බහාලුම් තුළ ඇති භාජන පිරිසිදුකාරක කුඩු වර්ග
6. බහාලුම් තුළ ඇති වාහන පිරිසිදුකාරක, වාහන ඉදිරිපස වීදුරු පිරිසිදුකාරක
7. මළු හෝ බහාලුම් තුළ ඇති ආයුර්වේද නිෂ්පාදන

මෙම විධානය වර්ෂ 2011 සැප්තැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

.. මාර්තු මස 16 වැනි දින,
..ළඹ දී ය.

..40